**කොවිඩ් 19 - සති පාසල**

**2021 - තුන්වන වාරය - නවවන සතිය**

**10 ශ්‍රේණිය** **භූගෝල විද්‍යාව**

# 6 පාඩම - ශ්‍රී ලංකාවේ කර්මාන්ත කිහිපයක ව්‍යාප්තිය, ගැටලු හා ප්‍රවණතා

**ආහාර හා පාන වර්ග නිෂ්පාදන කර්මාන්තය, ගෘහ කර්මාන්තය (පෙළ පොත පිටු අංක 129-132)**

- ශ්‍රී ලංකාවේ සකස් කරන ලද ආහාර හා පාන වර්ග (ඇසුරුම් කළ ආහාර හා පාන වර්ග), ආහාර හා පාන වර්ග නිෂ්පාදන කර්මාන්තයට අයත් වේ.
- කුඩා, මධ්‍ය පරිමාණ හා ගෘහ කර්මාන්ත ලෙස විවිධ මට්ටමේ ආයෝජකයින් රැසක් මෙම කර්මාන්තයෙහි නිරතව සිටී.
- කාර්ය බහුල ජීවන රටාව තුළ සකස් කරන ලද ආහාර සඳහා ඉල්ලුම වැඩි වීමත්, ආහාර නිෂ්පාදන රැසක් අපනයනය සඳහා යොදා ගැනීමත්, ආකර්ෂණීය ප්‍රචාරණ ක්‍රම යොදා ගැනීමට යොමු වීමත් මෙම කර්මාන්තය තුළ වර්තමානයේ දක්නට ඇති ප්‍රවණතා වේ.
- ගෘහ කර්මාන්ත යනු සුළු ආයෝජනයක් සහිතව, බොහෝ විට පවුලේ ශ්‍රමය මත, ව්‍යවසායකයාගේ නිවස තුළ හෝ ආසන්නයෙන් පවත්වාගෙන යනු ලබන කර්මාන්ත වේ.
- ගෘහ කර්මාන්තයන්හි ඇති විශේෂත්වය වන්නේ බොහෝ විට දේශීය සාම්ප්‍රදායික ශිල්ප ක්‍රම යොදා ගැනීම නිසා දේශීය කලා සම්ප්‍රදායන් හා සංස්කෘතික උරුමයන් සුරැකීමයි.
- අත් යන්ත්‍ර රෙදි විවීම, බීරළු හා කැටයම් කැපීම, වේවැල් භාණ්ඩ නිෂ්පාදනය, මැටිභාණ්ඩ නිෂ්පාදනය, පිත්තල භාණ්ඩ නිෂ්පාදනය මෙරට ගෘහ කර්මාන්ත කිහිපයකට උදාහරණ වේ.

**ක්‍රියාකාරකම**

01. ආහාර හා පාන වර්ග නිෂ්පාදන කර්මාන්තය ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| ආහාර හා පාන වර්ග නිෂ්පාදන කර්මාන්තය | | | | |
|---|---|---|---|---|
| විවිධ මට්ටම් | නිෂ්පාදන භාණ්ඩ | ව්‍යාප්තිය | ගැටලු | ප්‍රවණතා |
| | | | | |

02. ගෘහ කර්මාන්තයක් යන්න හඳුන්වන්න.

03. මෙම කර්මාන්තයෙහි කැපී පෙනෙන ලක්ෂණයක් ලියන්න.

04. මෙරට දක්නට ඇති ගෘහ කර්මාන්ත පහක් ලියන්න.

05. ගෘහ කර්මාන්තයන්හි දක්නට ඇති ප්‍රවණතා හා ගැටලු තුන බැගින් සඳහන් කරන්න.

06. ගෘහ කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් සඳහන් කර ඉන් එකක් පැහැදිලි කරන්න.